# ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන සමාජ නවීකරණය හමුවේ පුරාවිද්‍යා උරුමය අභියෝගයකට ලක්වීම පිළිබඳව විමර්ශනයක්: මොනරාගල දිස්ත්‍රික්කයේ වළගම්බා රජමහා විහාරය ඇසුරිනි

මහින්ද බණ්ඩාර

රුහුණු විශ්වවිද්‍යාලය
methmalmahindatt@gmail.com

---

ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන්නා වූ සමාජ නවීකරණය ඇතැම් විටෙක එකී ප්‍රදේශයන්ගේ පවතින්නා වූ උරුමයන් විනාශවීම කෙරෙහි හේතුකාරකයන් වේ. මිනිස් අවශ්‍යතාවයන් ක්‍රමයෙන් පුළුල්වීමත් සමගම ඔවුන් එකී අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා උනන්දු වේ. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ආදායමවන්නේ කෘෂිකර්මාන්තයේ නියැලීමයි. ක්‍රමිකව සිදුවන සමාජ නවීකරණය හමු වේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාව තම කෘෂිකාර්මික කටයුතු සඳහා පුරාවිද්‍යා උරුම භූමි ද යොදාගන්නා අන්දම දැකගත හැකිය. මෙම අධ්‍යයනයේ දී අධ්‍යයන ගැටළුව බවට පත් වූයේ ග්‍රාමීය ප්‍රදේශයන්හි සමාජ නවීකරණය හමුවේ පුරාවිද්‍යා උරුම අභියෝගයට ලක්වන්නේ ද? යන්නය. මෙහි පර්යේෂණ ක්ෂේත්‍රය වූයේ මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කතරගම ප්‍රධාන මාර්ගයේ ගෝනගංආර ග්‍රාමයේ මැණික් ගඟ අසබඩ පිහිටි පුරාවිද්‍යා පරිශ්‍රයය. මෙම ක්ෂේත්‍ර ගවේෂණය 2014 වසරේ මුල්භාගයේ දී සිදු කළ අතර මෑතකාලීන මනුෂ්‍ය ක්‍රියාවන් නිසා ක්ෂේත්‍රයට සිදුවී ඇති බලපෑමේ තීව්‍රතාව (Impact of the recent site Modification) කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. ක්ෂේත්‍රයේ දී ඡායාරූපගැනීම, ක්ෂේත්‍රයේ සැලසුම් ඇඳීම, නිදර්ශක රැස්කිරීම සිදුකරනු ලැබිණි. තව ද මූලික ගවේෂණයෙන් ක්ෂේත්‍රය පුරා විසිරී ගිය වළං කැබලි, උළු කැබලි, ගඩොල් කැබලි, ගල් කණු මෙන් ම දාගැබ හා පැරණි ගොඩනැගිලි කිහිපයකම අවශේෂ හමු වූ අතර සුවිශේෂී ලෙස පෙති උළු විශේෂයක් ද දැකගත හැකිය. මෙම ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් අවධානය යොමු වූයේ මේ වන විට පන්සලට අයත් නොවන භූමියයි. පන්සල අවට ඇති මෙම භූමියෙහි කෙසෙල් සිටුවා ඇති අතර එයට වතුර ලබාගැනීම සඳහා බැඳ ඇති ජල ටැංකිය ඉදිකිරීමට ද යොදාගෙන ඇත්තේ ගල් කණු කොටස් බව පැහැදිලිය. එසේ ම ආයුධ මුවහත් කිරීමේ දී ගල්කණු යොදාගනු දැකිය හැකිය. කෙසෙල් වගාව පුරාවටම පුරාවිද්‍යාත්මකව වැදගත් සාධක රැසක් විනාශවෙමින් පවතියි. එසේ විනාශයට පත්වන්නා වූ පුරාවිද්‍යා සාධක අනාවරණය කිරීම මෙකී පර්යේෂණයේ මූලික අරමුණ විය. එසේම විහාරය නවීකරණය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම ද මෙහි යථාභූතභාවය විනාශ කිරීම සඳහා බලපානු ලබයි. එහෙයින් මෙම පරිශ්‍රය දැඩි අවදානම් සහගත තත්වයකට පත්ව ඇති බව දැකගත හැකිය.

ප්‍රමුඛ පද : සමාජ නවීකරණය, පුරාවිද්‍යා උරුම, පුරාවස්තු විනාශය, වළගම්බා විහාරය